1. නේෂන්ස් ළමා ගිණුම දෙමාපියන්ගෙන්/ නෛතික භාරකරු (භාරකරුවන්) ගෙන් ලැබෙන උපදෙස් මත බාලවයස්කරුගේ නමින් පාස්පොත් ඉතුරුම් ගිණුමක් ලෙස පමණක් විවෘත කෙරේ. බලයලත් පාර්ශ්වයකින් නිසි පරිදි බැංකුවට ලිඛිත දැනුම්දීමක් ලැබුණහොත් මිස නේෂන්ස් ළමා ගිණුම්හිමියා බාල වයස්කරුවෙකු ලෙස දිගටම සිටියත් නැතත් ඒ පිළිබඳව නොසලකා, ගිණුම් විවෘත කිරීමේ පෝරමයේ නම් කර ඇති දෙමාපියන්ගෙන්/ නෛතික භාරකරු (භාරකරුවන්) ගෙන් ලැබෙන උපදෙස් මත ක්‍රියා කිරීමට බැංකුවට අයිතියක් ඇත.

2. ගිණුම විවෘත කර ඇත්තේ කිනම් බාලවයස්කරුගේ නමින්ද, එකී බාලවයස්කරුවා ගිණුමට බැර කරනු ලබන තැන්පතුවල ප්‍රතිලාභියා විය යුතුය. එබැවින් බාලවයස්කරුවා වැඩිහිටි වයසට එළඹෙන තෙක් ගිණුමෙන් මුදල් ආපසු ගැනීමට සාමාන්‍යයෙන් අවසර දෙනු නොලැබේ.

3. කල්පිරෙන අවස්ථාව වනවිට, ගිණුම සාමාන්‍ය ඉතුරුම් ගිණුමක් බවට පරිවර්තනය කළ හැකිය. කෙසේවුවද, ප්‍රතිලාභියා විසින් (බාලවයස්කරු) අවශ්‍ය අදාළ ලියකියවිලි (ජාතික හැඳුනුම්පත්‍රය/විදෙස් ගමන් බලපත්‍රය) සමඟින් අළුතින් ඉතුරුම් ගිණුමක් ආරම්භ කිරීමේ පෝරමයක් සම්පූර්ණ කර බැංකුවට ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ. ගිණුම සාමාන්‍ය ඉතුරුම් ගිණුමක් බවට පරිවර්තනය කරනු ලැබීමෙන් අනතුරුව සහ ලිපිලේඛන සම්පූර්ණ කරනු ලැබීමෙන් පසුව, මෙම ගිණුම සම්බන්ධයෙන් දෙමාපියන්/භාරකරුවන් විසින් කරනු ලබන කිසිදු හිමිකම් පෑමක් බැංකුව විසින් සැලකිල්ලට ගනු නොලැබේ.

4. නේෂන්ස් ළමා ගිණුමක් විවෘත කිරීම සඳහා අවශ්‍ය අවම මූලික තැන්පතුව කලින් කලට වෙනස් විය හැකිය. අවම අවශ්‍යතාවයට වඩා අඩු ශේෂයක් පවත්වාගෙන යනු ලබන නේෂන්ස් ළමා ගිණුමක් පූර්ව දැනුම්දීමකින් තොරව අහෝසි කිරීමේ අයිතිය බැංකුව සතුය.

5. ගිණුම විවෘත කරන අවස්ථාවේදී බාලවයස්කරුගේ උප්පැන්න සහතිකයේ මුල් පිටපතක් බැංකුවේ පරීක්ෂාව සඳහා ඉදිරිපත් කළ යුතු අතර එම උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක් බැංකුව විසින් වාර්තාවක් වශයෙන් රදවා ගනු ඇත.

6. නේෂන්ස් ළමා ගිණුමේ ප්‍රතිලාභියා ගිණුම් හිමියා ලෙස හඳුන්වනු ලැබේ. බාලවයස්කාරුගේ මරණය හෝ අකර්මණ්‍යතාවයකදී ගිණුම යටතේ ඇති මුදල් දෙමව්පියන්ට/ නෛතික භාරකරු (භාරකරුවන්) ෘ හෝ සාමාන්‍ය ඉතුරුම් ගිණුමක් බවට පරිවර්තනය කළ ගිණුමකට ගෙවනු ලැබේ. කිසියම් හේතුවක් මත, ගිණුම් හිමියාගේ වයස අවුරුදු 18 සම්පූර්ණ වීමට පෙර මෙම ගිණුම අහෝසි කිරීමට සිදුවුවහොත්, අදාළ පොලී අනුපාතය බැංකුවේ අභිමතය පරිදි නීරණය කරනු ලැබේ.

7. තැන්පතු සහ මුදල් ආපසු ගැනීම් ශ්‍රී ලංකාවේ කලින් කලට බලපැවැත්වෙන නීති මගින් පාලනය වන අතර මූලික තැන්පතුව සිදු කළ බැංකු ශාඛාවට හෝ බැංකුවේ In-store ඒකක වෙත පමණක් ගෙවීම් සිදුකළ යුතුය. බැංකුවට පිළිගත හැකි අනන්‍යතාවය පිළිබඳ සාධක ඉදිරිපත් කරනු ලැබීමට සහ 2 වැනි වගන්තියේ දක්වා ඇති සීමාවට යටත්ව ශ්‍රී ලංකාවේ අනෙකුත් ඕනෑම ශාඛාවකින් මුදල් ආපසු ගැනීමට බැංකුවට තම අභිමතය පරිදි අවසර ලබා දිය හැකිය.

8. නේෂන්ස් ළමා ගිණුමට ගෙවිය යුතු පොලී අනුපාතය බැංකුව විසින් නීරණය කරනු ලබන අතර බැංකුව විසින් ශ්‍රී ලංකාවේ එහි විවිධ

ශාඛාවල සහ In-store ඒකකවල එය ප්‍රදර්ශනය කරනු ලැබිය හැකිය. එම පොලී අනුපාතය ගිණුම් හිමියාට හෝ ගිණුම් විවෘත කිරීමේ පෝරමයේ නම් කර ඇති දෙමාපියන්ට / නෛතික භාරකරු (භාරකරුවන්) ෘ දැනුම්දීමක් සිදුකර සංශෝධනය කරනු ලැබිය හැකිය. නේෂන්ස් ළමා ගිණුමේ පොලිය දෛනිකව හෝ බැංකුව විසින් තීරණය කරනු ලබන වෙනත් ආකාරයකට (එහි අභිමතය පරිදි) එකතු වන අතර එය මාසිකව නේෂන්ස් ළමා ගිණුමට බැර කරනු ලැබේ.

9. බාලවයස්කාර දරුවා වයස අවුරුදු 18 සම්පූර්ණ වීමට පෙර බැංකුවේ තනි අභිමතය පරිදි තීරණාත්මක අවශ්‍යතා සඳහා පමණක් ගිණුමෙන් මුදල් ආපසු ගැනීමට අවසර දෙනු ලැබේ.

10. බැංකුව විසින් කලින් කලට තම අභිමතය පරිදි නේෂන්ස් ළමා ගිණුම හා සම්බන්ධව යම් යම් ත්‍යාග සහ/හෝ වරප්‍රසාද ලබා දීමට තීරණය කළ හැකිය. කෙසේවෙතත්, ඕනෑම අවස්ථාවක දැනුම් දීමක් කර එවැනි ත්‍යාග සහ/හෝ වරප්‍රසාද ප්‍රදානය අවලංගු කිරීමට, ඉවත් කිරීමට හෝ ඉල්ලා අස්කර ගැනීමට බැංකුවට අයිතියක් ඇත. නේෂන්ස් ළමා ගිණුම යටතේ ත්‍යාගයක් හෝ වරප්‍රසාදයක් ලබා ගැනීමට අවශ්‍ය සුදුසුකම් නිර්ණායක සපුරාලීමට අපොහොසත් වී ඇති බව අනාවරණය වුවහොත්, ගිණුමෙන් හර කිරීමක් හරහා, ඒ වනවිටත් ලබා දී ඇති එවැනි ත්‍යාගයක හෝ වරප්‍රසාදයක වටිනාකම හෝ පිරිවැය, නේෂන්ස් ළමා ගිණුමෙන් අයකර ගැනීමට ඕනෑම අවස්ථාවක බැංකුවට අයිතියක් ඇත.

11. බැංකුව විසින් මෙම නියමයන් සහ කොන්දේසි හෝ නේෂන්ස් ළමා ගිණුමට අනුයුක්ත කර ඇති යම් වරප්‍රසාදයක් ඕනෑම අවස්ථාවක දෙමාපියන්ට භාරකරුට(වන්ට) ලිපියක් මගින් සහ/ හෝ අභ්‍යන්තර පුවත්පත්වල සහ/ හෝ බැංකු ශාඛාවල දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කිරීම මගින් දන්වා සංශෝධනය කරනු ලැබිය හැකිය.

12. මෙම නියමයන් සහ කොන්දේසි ශ්‍රී ලංකාවේ පවතින නීති වලට අනුකූලව පාලනය කරනු ලැබේ. ගිණුම්හිමියා සහ ගිණුම් විවෘත කිරීමේ පෝරමයේ නම් කර ඇති දෙමාපියන් / භාරකරු (වන්) අවලංගු කළ නොහැකි ලෙස ශ්‍රී ලංකාවේ සිවිල් අධිකරණවල සුවිශේෂී නොවන අධිකරණ බලයට යටත් වේ.

13. ත්‍යාගය ප්‍රදානය කරන අවස්ථාවේ වයස අවුරුදු 15 ට අඩු ගිණුම් හිමියන්ට පමණක් ත්‍යාග නිකුත් කරනු ලැබේ.

මා විසින් මෙහි ඉල්ලුම් කර ඇති නිපැයුම (ම්) / සේවාව(වන්) සඳහා අදාළවන නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පීඑල්සී හි සාමාන්‍ය ව්‍යාපාර කොන්දේසි වල සහ අනෙකුත් නියමයන් සහ කොන්දේසි වල පිටපත් එකී නිපැයුම (ම්) /සේවා වලට (වන්ට) අදාළ විස්තර සමග මා මෙහි අන්සන් කිරීමට පෙර මට ලබා දී පැහැදිලි කරන ලද බව මම මෙයින් තහවුරු කර අතර මම එහි අඩංගු විස්තර, නියමයන් සහ කොන්දේසි හොඳින් කියවා අවබෝධ කර ගෙන ඇති අතර එයට එකඟ වී බැඳී සිටීමට මාගේ කැමැත්ත ප්‍රකාශ කරමි.

.....

.....

ගනුදෙනුකරුගේ අන්සන

දිනය: